# සාංදෘෂ්ටිකවාදය පිළිබඳ හැඳින්වීමක්

ගෝනලගොඩ නන්ද හිමි

## හැඳින්වීම

සමකාලීන දාර්ශනික යුගයට අයත් සුවිශේෂී දාර්ශනික තේමාවක් වශයෙන් සාංදෘෂ්ටික වාදය හඳුනාගත හැකිය. ප්‍රංශය හා ජර්මනිය කේන්ද්‍ර කරමින් බිහි වූ සාංදෘෂ්ටික වාදය මිනිසා හා මිනිසාගේ පැවත්ම සම්බන්ධයෙන් නවමු සාකච්ඡාවක් ඇති කරමින් බිහි වූවකි. 19වන හා 20වන සියවස් තුළ ඇති වූ සමාජ හා සංස්කෘතික පෙරළිය හේතුවෙන් මිනිසා මිනිසාගෙන් ඈත් වන්නට විය. එබැවින් මිනිසා යනු කවුරුන් ද යන ගැටලුව සමාජයෙහි වර්ධනය වූ අතර එය මානවීය වශයෙන් විවරණය කිරීම සාංදෘෂ්ටිකවාදීන්ගෙන් සිදු විය. එහෙත් සමකාලීන දාර්ශනික යුගයට පෙරාතුව ද සාංදෘෂ්ටික වාදී අදහස් පැවතිණි. පෙරදිග දර්ශනයෙහි බුදුන් වහන්සේ ඉගැන්වීම් සම්බන්ධයෙන් සාකච්ඡා කරන කල්හි සාංදෘෂ්ටිකවාදී ඉගැන්වීම් සුලභව හඳුනාගත හැකිය. එසේම තේල්ස්, සොක්‍රටීස්, ප්ලේටෝ, ඇරිස්ටෝටල් වැනි බටහිර දාර්ශනිකයන්ගේ සංකල්පයන්හි ද අඩු වැඩි වශයෙන් සාංදෘෂ්ටිකවාදී අදහස් ගැබ්ව ඇත. එලෙස විවිධ දාර්ශනික තේමා ආශ්‍රය කරමින් 19වන සියවසේ පමණ නව දාර්ශනික තේමාවක් වශයෙන් බිහි වූ සාංදෘෂ්ටිකවාදය මිනිසාගේ පැවැත්මේ හරය මෙසේ විය යුතුය යන ප්‍රමිතකරණයෙන් හා පූර්ව විනිශ්චයාත්මක හරසාධනයකින් තොර වූ දාර්ශනික ප්‍රවාහයක් ලෙස හඳුනාගත හැකිය.[1] එබැවින් මෙම අධ්‍යයනයේදී අපේක්ෂා කරනුයේ සාංදෘෂ්ටිකවාදය සම්බන්ධයෙන් හැඳින්වීමක් සිදු කිරීමය. සමකාලීන දර්ශනය නියෝජනය කරන ප්‍රධාන සාංදෘෂ්ටිකවාදී දාර්ශනිකයන්ගේ විග්‍රහ ආශ්‍රයෙන් කරුණු දැක්වීමට අපේක්ෂා කෙරේ. ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ තේමා විශ්ලේෂණ හා සංධාර පර්යේෂණ ක්‍රමය මෙහිදී උපයුක්ත කොට ඇත.

**සංදර්භය**

ලතින් 'Existence' යන වචනයෙන් බිහි වූ පදයක් වන 'Existentialism' යන වචනය තුළ පැවත්ම යන අර්ථය ඇත. ලතින් වචනයට අනුව නැගී සිටීම, මතුවීම, උද්භවය හෝ එළියට ඒම වැනි අරුත් ඉන් ගම්‍ය කරයි[2] . සාංදෘෂ්ටික වාදය යන ව්‍යවහාරයට අමතරව අස්තිත්වවාදය, ප්‍රවර්තනවාදය, සත්තාවාදය, භවසත්තාවාදය ආදී පාරිභාෂික පදවලින් ද සාංදෘෂ්ටික වාදය හැඳින් වේ.[3] සාංදෘෂ්ටිකවාදයෙහි ප්‍රභවයට මූලික හේතු ද්විත්වයක් බල පා ඇති බව දැකිය හැකිය. ඉන් පළමු සාධකය වනුයේ මානව ඉතිහාසය පුරාවට මිනිසාගේ පැවත්මට ලැබී තිබුණ තත්වය ඉතා අල්ප වීමයි. දෙවන කරුණ වනුයේ 18 හා 19වන සියවස්වල යුරෝපීය සමාජයන්හි ඇති වූ යුධමය තත්වයයි.[4] මින් පළමු කරුණ සම්බන්ධයෙන් සාකච්ඡා කරන කල්හි බටහිර මෙන්ම පෙරදිග දර්ශනයෙහි ද වැඩි වශයෙන් අවධානය යොමු කොට ඇත්තේ මිනිසාගේ පැවත්ම වෙනුවට දෙවියන්ගේ පැවත්ම තහවුරු කිරීම බව පෙනේ. දෙවන කරුණ වන යුධමය තත්ත්වය යටතේ මිනිසා මිනිසාගේම අවියක් වශයෙන් විනාශයට පත්වීම හා අපගාමී චර්යාවන් වර්ධනය වූ හෙයින් මිනිසා යනු කවරෙක් ද? යන ගැටලුව ඇති විය. එබැවින් මෙයට විකල්පයක් වශයෙන් සාංදෘෂ්ටික වාදය බිහි වූ බව පෙන්වා දී තිබේ. විශේෂයෙන් සාංදෘෂ්ටික වාදය හා සමීපව ගමන් කරන ප්‍රධාන ක්ෂේත්‍රයක් පවතී. එනම් සාහිත්‍යයයි. නාට්‍ය, නවකථා, කවි හා ගීත ආදී විවිධ තේමාවන්ගෙන් සාංදෘෂ්ටික වාදී අදහස් ජන විඥානගත වූ බව පැහැදිලි කරුණකි. එහෙත් ඉවාන් තුර්ගි නොව් රචිත (Fathers and sons) කෘතියෙහි දැකිය හැකි වනුයේ නාස්තිකවාදයකි. මේ හේතුවෙන් ඇතැම් තන්හි සාංදෘෂ්ටික වාදය නාස්තික වාදයක් සේ ද සලකා ඇත.[5] සාංදෘෂ්ටික වාදයෙහි ප්‍රධාන ප්‍රභේදත්වයක් පවතී.

'There are two kinds of existentialist; first, those who are Christian, among whom I would include Jaspers and Gabriel Marcel, both Catholic; and on the other hand the Atheistic existentialists'[6]

සාත්‍රේ පැහැදිලි කරන පරිදි සාංදෘෂ්ටික වාදයෙහි ඇති ප්‍රධාන ප්‍රභේදය වනුයේ ඊශ්වර වාදී එළඹුම හා අනීශ්වර වාදී එළඹුමයි. සොරේන් කියකිගාර්ඩ්, කාල් ජැස්පස්, ගාබ්‍රියෙල් මාෂල් ආදී චින්තකයන් ඊශ්වර වාදී චින්තකයන් ලෙස හඳුනාගත හැකි අතර හෛඩෙගර්, ජීන් පොල් සාත්‍රේ, ඇල්බෙයා කැමූ ආදී චින්තකයන් හඳුනාගත හැකි වනුයේ අනීශ්වර වාදී සාංදෘෂ්ටික වාදීන් වශයෙනි.[7] මෙයින් ඊශ්වර වාදී චින්තකයන්ගේ අදහස වනුයේ 'සාරය පැවත්මට පූර්වයි' යන මතයයි. ඊශ්වර වාදීහු මිනිසා නොව දෙවියන් වහන්සේ පරම සත්වය ලෙස පිළිගත්හ. මේ සම්බන්ධයෙන් රෙනේ ඩේකාට්ස් සුවිශේෂී අදහසක් ඉදිරිපත් කොට ඇත.

'මා වෙත නොමැති කිසියම් සම්පූර්ණත්වයක් (Perfections) පිළිබඳ ඥානයක් මා වෙත පැවතීමෙන් පෙනෙනුයේ, සත්වයකින් (Existence) යුතු එකම තැනත්තා මා පමණක් නොවන බවයි. මා වෙනත් කිසිවකු නිසා පවතිමි. මා හට හිමි හැම දෙයක්ම මොහුගෙන් ලද්දේය. මාගේ පැවත්මෙහි උත්පාදකයා ද මා නොවෙමි. මෙසේ වෙනත් කිසි සත්ත්වයාන කෙනෙකු හේතු කොටගෙන පැවතෙන අනියත මා වෙත, සම්පූර්ණත්වයක් පිළිබඳ ඥානයක් තිබෙන්නේ මන්ද? මා හට වඩා උපරිම සම්පූර්ණත්වයෙන් සහ ශ්‍රේෂ්ඨත්වයෙන් යුතු සත්ත්වයාන කෙනෙකුන් සිටින හෙයිනි. ඒ සර්වබලධාරී දෙවියන් වහන්සේය.'[8] ඩේකාට්ස්ගේ කොජිටෝ (Cogito) තර්කයෙන් ද දෙවියන්ගේ සත්තාව තහවුරු කිරීම වක්‍රව සිදු කොට ඇත.

මේ ආකාරයට දළ වශයෙන් තේරුම් ගත හැකි සාංදෘෂ්ටික වාදයෙහි මූලික අරමුණ වනුයේ මිනිසාගේ පැවත්ම පිළිබඳ විමසීමය. පූර්වයෙන් සඳහන් කළ පරිදි පූර්ව චින්තකයන්ගේ අවධානය යොමු වූයේ සාරය පිළිබඳ විමසීමටය. නමුත් සාංදෘෂ්ටික වාදය ඇතිවීමට පූර්ව දාර්ශනික තේමා හේතු නොවූ බව කිව නොහැකිය. විශේෂයෙන් දෙවන ලෝක යුද්ධයෙන් පසු රචනා කරන ලද සාහිත්‍ය ග්‍රන්ථ ඒ සඳහා දැඩි බලපෑමක් සිදුකොට ඇත. රුසියානු නවකතා කරුවකු වන ඩොස්ටොවුස්කි රචනා කරන ලද 'කැරමසොප් සහෝදරයෝ' නම් නවකතාව සාංදෘෂ්ටික අදහස් විශාල වශයෙන් අන්තර්ගත වූවකි. මිනිස් ජීවිතයේ අර්ථ ශූන්‍යත්වය හේතුවෙන් කිසිවක් කරගත

නොහැකිව, පීඩිතව, අසරණ වූ මිනිසුන් ජීවිකාව ගෙන යන අයුරු ඉන් කිය වේ. තවද පස්කාල් නම් චින්තකයා රචනා කරන ලද 'පන්සෙස්' කෘතියෙන් ද වැඩි වශයෙන් අවධාරණය කොට ඇත්තේ මිනිස් ජීවිතයේ අර්ථ ශූන්‍යත්වයයි.[9]

මීට අමතරව නීට්ෂේගේ දාර්ශනික සංකල්ප සාංදෘෂ්ටික වාදය කෙරෙහි ඍජුව බලපාන්නට ඇති බව සිතිය හැකිය. සාම්ප්‍රදායික අදහස් පිළිගැනීම හෙයින් මිනිසා මිනිසාව අමතක කොට ඇති බව මොහු දක්වයි.[10] නමුත් නීට්ෂේගේ දාර්ශනික මැදිහත් වීම තරමක් දෘඪ බවක් ඇති දාර්ශනික මැදිහත් වීමකි. බලය සම්බන්ධයෙන් ඉදිරිපත් කොට ඇති ප්‍රකාශය ඊට හේතුවකි. සෑම පුද්ගලයෙකුටම බලය පිළිබඳ අදහසක් ඇති බැවින් එය ලබා ගැනීමට උත්සහ ගත යුතු බව මොහු දැඩිව ප්‍රකාශ කොට ඇත. හිට්ලර් විසින් නීට්ෂේ වැදගත් කොට සලකන ලද්දේ එබැවින් විය හැකි හැකිය. මෙලෙස විවිධ දාර්ශනිකයන්ගේ ආභාසය ලබමින් වර්ධනය වූ සාංදෘෂ්ටික වාදය සම්බන්ධයෙන් පූර්වයෙන් සඳහන් කළ පරිදි කොටස් දෙකක් යටතේ කරුණු අධ්‍යයනය කළ හැකි වේ. එබැවින් දේවවාදී හා අදේවවාදී යන අංශද්වය නියෝජනය කරන ප්‍රධාන දාර්ශනිකයන් ආශ්‍රයෙන් මෙතැන් සිට කරුණු අධ්‍යයනයෙහි නියැලීමට අපේක්ෂා කෙරේ.

### සොරේන් කියකිගාඩ් (Soren Kierkergard)

ඩෙන්මාර්කයේ උපත ලද කියකිගාඩ් සාංදෘෂ්ටික වාදයේ පියා වශයෙන් හඳුන්වනු ලැබේ. ඊශ්වර වාදී පදනමක ස්ථාවර වෙමින් සිය දර්ශනය ඉදිරිපත් කළ කියකිගාඩ් සාංදෘෂ්ටික වාදයට මූලික පදනම සැකසූ දාර්ශනිකයා ලෙස හැඳින්වේ. එතෙක් යම් යම් ආකාරයේ සාංදෘෂ්ටික අදහස් පැවතිය ද මූලික පදනමක් තිබූ බවක් දැකිය නොහැකිය. විශ්වය පිළිබඳ මනෝ මූලික සංකල්ප බැහැර කිරීම එකී මූලික පදනමයි. කියකිගාඩ් පුද්ගලික ජීවිතයේ පැවැත්ම පිළිබඳ අවධාරණය කරයි. මෙමඟින් මොහු අවධාරණය කරනුයේ පැවැත්ම වනාහි පුද්ගලික වන බවයි.

> ජීවත් වන පුද්ගලයාට තම පැවැත්ම (Existence) හෙවත් ජීවත් වීම සැබෑ තත්වයකි. එය සිතුවිල්ලක් (thought) නොවේ.

ජීවත් වීම කල්පනාවක් පමණක් වන්නේ නම් එවිට පුද්ගල බවක් ඉතිරි නොවේ. එවිට මිනිසාට තමාව ද නැති වී යයි.

පැවැත්ම චලනයෙන් ප්‍රකාශ වේ. එම චලනය නොකඩවා සිදුවන විට පැවැත්ම ද අඛණ්ඩව පවතී.

පැවැත්ම ඉදිරියට ගලාගෙන යන විට වගකීම් සහිත තීරණ ගත හැකි වෙයි.[11]

මේ ආකාරයට පුද්ගල පැවත්ම පිළිබඳ පුද්ගලික වශයෙන් විවරණය කිරීම කියකිගාඩ් සිදු කළ ද මොහු ඊෂ්වර වාදී සාංදෘෂ්ටික වාදියෙකු ලෙස සැලකේ. එයට හේතුව වනුයේ මිනිසාගේ පුද්ගලික ජීවිතයේ පැවත්ම පිළිබඳ කථා කල ද දෙවියන් වහන්සේගේ පැවත්මෙන් විතැන් වීමට නොහැකි වීමය. කියකිගාඩ් අවධාරණය කරණ ලද්දේ මිනිසා සැපත පසුපස හඹායන බවයි. එය අශ්වයා හා කැරට් අලය නමැති නිදසුනකින් මොහු පැහැදිලි කරයි. අශ්වාරෝහකයෙකු තමාට ගමනක් යාමට අවශ්‍ය වූ විට කැරට් අලයක් අශ්වයා ඉදිරියේ එල්ලන අතර කැරට් අලය අල්ලා ගැනීමේ රුචිකත්වයෙන් අශ්වයා වේගයෙන් දිව යන බවට කියමනක් පවතී. ඒ අයුරින්ම මිනිසා ද අසීමාන්තික ආසාවන් පසුපස හඹායන බව කියකිගාඩ් සඳහන් කරයි. මොහු ලෞකික ජීවිතයේ ප්‍රධාන ලක්‍ෂණ දෙකක් ඇති බව දක්වා ඇත.

ඉච්ඡාභංගත්වය

සන්තාපය[12]

මෙම මූලික ස්වභාවයන් හේතු කොටගෙන මිනිසා මිනිසාව අමතක කොට ඇති බව කියකිගාඩ් දක්වයි. පුද්ගලයා විවිධ ආශාවන් පසුපස හඹා ගිය ද එය සාක්‍ෂාත් කිරීමෙන් පසු නැවත මිරිඟුවක් සේ දිස්වන බව මොහු දක්වයි. තමාගේ ඉලක්කය සාක්‍ෂාත් කිරීමට නොහැකි වූ විට ඉච්ඡාභංගත්වයක් ඇති වන අතර ඒ පිළිබඳ කල්පනා කිරීම මගින් සන්තාපයක් ඇති වේ. කියකිගාඩ් ඉහත පුද්ගල ස්වභාවයන්ට යෝජනාවක් වශයෙන් අනුගමනය කළ යුතු පියවර තුනක් ඉදිරිපත් කොට ඇත.

1. ශෘංගාරාත්මක හෙවත් ආස්වාදජනක ජීවිතය

2. ආචාරාත්මක ජීවිතය

3. ආගමික ජීවිතය[13]

මිනිසා කලකිරීමට පත්වන්නේ ඉහත පළමු පියවරෙන් බව කියකිගාඩ් දක්වයි. ස්වභාවයෙන්ම විවිධ ආශාවන්ගෙන් යුක්ත මිනිසා ආස්වාදජනක ජීවිතයට ප්‍රිය කරයි. නමුත් ශෘංගාරාත්මක ජීවිතයේ ආශාවන් සාක්ෂාත් කිරීමට නොහැකි වූ තැන ආචාරාත්මක ජීවිතය තෝරාගනී. පූර්වයෙන් සඳහන් කළ ඉච්ඡාභංගත්වය හා සන්තාපය ආචාරාත්මක ජීවිතයට හේතු වේ. ආචාරාත්මක ජීවිතය ගත කිරීම සිදුවන විට ආගමික පියවර අනුගමනයට පෙළඹේ. එය තරමක් අපහසු වුවද ජීවිතයේ සැබෑ අරුත තේරුම් ගැනීමට නම් ආගමික ජීවිතයට ඇතුලත් විය යුතු බව කියකිගාඩ් දක්වයි. ආගමික පියවර අවසන් වනුයේ දෙවියන් වහන්සේගෙනි. ඊට හේතුව වනුයේ ජීවිතයේ ඇති විවිධ ගැටලුවලට විසඳුම දෙවියන් වහන්සේගෙන් ලබාගත හැකි වීමය. දෙවියන් වහන්සේ කරා යාමට පුද්ගලයා අනිවාරයෙන් ආගමික ජීවිතයක් ගත කළ යුතු වේ. කියකිගාඩ්ගේ අවසන් නිෂ්ටාව දෙවියන් වහන්සේ බැවින් මොහු ඊශ්වරවාදී සාංදෘෂ්ටික වාදියෙකු ලෙස සැලකේ.

## ගාබ්‍රියෙල් මාර්සෙල් (Gabrial Marcel)

ඊශ්වරවාදී සාංදෘෂ්ටික වාදියෙකු ලෙස හඳුනාගත හැකි මාර්සෙල් මිනිසා සම්බන්ධයෙන් දක්වා ඇත්තේ මිනිසා විසින්ම මිනිස් ස්වභාවය නැති කරගෙන ඇති බවයි. කාර්මීකරණය හා නිෂ්පාදනමය ආර්ථික තත්වය හමුවේ මිනිසාට මෙම තත්වය ඇති වී ඇති බව මාර්සෙල් දක්වයි. කාර්මික සමාජයේ මිනිසා යන්ත්‍රයක ස්වභාවයක් උසුලන හෙයින් යන්ත්‍ර මගින් මිනිසා පාලනය කරන බව මොහු දක්වා ඇත. ඒ හේතුවෙන් මානවීය ගුණ ධර්ම වන ආදරය, දයාව, කරුණාව, මානව භක්තිය ආදීය[14] මිනිසාගෙන් ඈත් වෙමින් පවතී. මිනිස් පැවත්මට අවශ්‍ය මානවීය ගුණදහම් ඈත් වූ විට තමා තුළ පවතින ස්වකීය පෞෂත්වය තේරුම් ගැනීමට නොහැකි වේ. යන්ත්‍රයක් සේ අදාල කාර්ය ඉටු කිරීමට පමණක් පෙළඹෙන

හෙයින් මානව සබඳතා වර්ධනයට උත්සහ නොගනී. එවිට මිනිසා ද ස්වභාවයෙන් යන්ත්‍රයක තත්වයට පත් වේ. මෙයට විසඳුමක් ලෙස මාර්සෙල් දක්වනුයේ ආගමික භක්තියයි. ලොව පවත්නා පරම සත්‍යය දෙවියන් වහන්සේ බව පිළිගන්නා මාර්සෙල් දෙවියන් වහන්සේ කෙරෙහි දැඩි භක්තියක් ඇති කොට ජීවිතයේ පරමාර්ථය ලබාගත යුතු බව අවධාරණය කොට ඇත.[15]

## කාර්ල් ජැස්පර්ස් (Karl Jaspers)

මනෝවිද්‍යාඥයෙකු වූ ජැස්පර්ස් පුද්ගලිකත්වය හීනවන අයුරු සාකච්ඡාවට ලක්කොට තිබේ. පුද්ගල පෞරුෂය බිඳ වැටීමට හෙවත් හීන වීමට හේතුව වශයෙන් මොහු දක්වනුයේ බාහිර ඇගයුම්වලට යටවීමයි. ක්‍රිස්තියානි පල්ලිය තුළින් නියම තත්ත්වය දැකිය නොහැකි අතර හදාගත් සිරිත් විරිත්වලට ගැතිවීම නිසා යථාර්ථය යටපත් වී ඇති බව මොහු දක්වයි. මෙයට විකල්පයක් ලෙස මොහු යෝජනා කරනුයේ පුද්ගල අභ්‍යන්තරය අධ්‍යයනය කළ යුතු බවයි. මාක්ස් වාදය, මානව විද්‍යාව, සමාජ විද්‍යාව වැනි විෂයන් මගින් පුද්ගල බාහිරත්වය අධ්‍යයනය කළ ද කළ යුතු වනුයේ පුද්ගල අභ්‍යන්තරය අධ්‍යයනය කිරීමකි. ජැස්පර්ස් සඳහන් කරනුයේ ජීවිතය අර්ථවත් කිරීමට නම් සත්තාව අවබෝධ කරගත යුතු බවයි. මොහුට අනුව සියල්ලෙහි පරම සත්‍ය පැවත්ම තුළ පවතී. පැවත්ම යනු දෙවියන් වහන්සේය. ඒ අනුව මොහු ද ඊශ්වර වාදී සාංදෘෂ්ටික චින්තකයන් සේ සියල්ල දෙවියන්ගේ පැවත්මට බාර කොට ඇත. ඊශ්වර වාදී සාංදෘෂ්ටික වාදය වෙනුවට අදේව වාදී සාංදෘෂ්ටික වාදයක් ද බිහිව පැවතිණි. එබැවින් මෙතැන් සිට අදේව වාදී සාංදෘෂ්ටික වාදීන් පිළිබඳ කරුණු අධ්‍යයනය කරනු ලැබේ.

## ජීන් පෝල් සාත්‍රේ (Jean paul sartre)

අදේවවාදී සාංදෘෂ්ටික දාර්ශනිකයෙකු වශයෙන් හඳුනාගත හැකි ප්‍රංශ ජාතික සාත්‍රේ නවකතා, කෙටිකතා, නාට්‍ය, කවි, පුවත්පත් ලිපි ආදී සාහිත්‍ය උපයෝගී කරගනිමින් සිය මතවාදය ව්‍යාප්ත කිරීම සිදු කළේය. විවිධ ක්ෂේත්‍ර පිළිබඳ පෘථුල විදග්ධ භාවයකින් යුතු වූ මොහු විසිවන සියවසේ ලොව පහළ වූ බුද්ධිමතා යන අන්වර්ථයෙන් ද හඳුන්වන්නට විය.[16] 'ඔක්කාරය, නම්බුකාර අබිසරුලිය, මියුර්,

ධවල භීෂණ' ආදි ග්‍රන්ථකරණයන් මගින් මිනිසාගේ පැවැත්ම පිළිබඳ සාකච්ඡා කළ සාත්‍රේ පුද්ගල ස්වඡන්දතාවය අවශ්‍ය සාධකයක් බවට පත් විය යුතු බව අවධාරණය කළේය. මොහු සියලු බැඳීම්වලින් නිදහස් විය යුතු බව අවධාරණය කළ දාර්ශනිකයෙකි.

මිනිසාගේ පැවත්ම පිළිබඳ සාත්‍රේගේ විග්‍රහය අතිශයින් මානවීය වන්නකි. මොහුට අනුව ලෝකයේ පවතින වස්තුවල ආකාර දෙකකි. සමහර වස්තු තමා සඳහා පවතින අතර සමහර වස්තු අනෙකක් වෙනුවෙන් පවතී. පුටුව ගත්කල එය පවතිනුයේ පුටුව සඳහා නොවේ. අනෙකක් සඳහාය. එහෙත් මිනිසා පුටුව හා සමාන නොවේ. එසේ සමාන වන්නේ නම් එය හුදු ද්‍රව්‍යක් මිස මිනිසෙක් නොවේ. නිදසුනක් ලෙස යම් කර්මාන්ත ශාලාවක සේවය කරන සේවකයෙකු ගතහොත් ඔහු සිදු කරනුයේ ඔහුට හිතෙන දේ නොවේ. ඔහුට පැවරෙන දේය. යන්ත්‍රය ද මේ හා සමානය. යන්ත්‍රයක් මගින් සිදු කරනුයේ වෙනත් අයෙකුගේ ක්‍රියාවකි. මිනිසා ද ඇතැම් අවස්ථාවල එසේ යන්ත්‍රයක තත්වයට පත් වේ. එවැනි අවස්ථාවල මිනිසා මිනිස්කමින් පිරිහෙන බව මොහුගේ අදහසයි. එමගින් සාත්‍රේ මතු කිරීමට උස්සහ කරනුයේ මිනිසා, මිනිසා නිෂ්ටාව කොට පැවතිය යුතු බවයි. පුද්ගලයාට ඕනෑම තීරණයක් ගැනීමට හැකියාවක් ඇත. එය දේව නියමයෙන් හෝ වෙනත් නියමයකින් විය යුත්තක් නොව ස්ව කැමත්තට අනුව විය යුත්තකි.

වරක් එක් පුද්ගලයෙකු සාත්‍රේ වෙත පැමිණ ප්‍රශ්නයක් විමසයි. තමා ආදරණීය මව ළඟ නතර වන්න ද යුද්ධ කිරීම පිණිස යුධ සේවයට යන්න ද යනුවෙන් විමසයි. එහිදී සාත්‍රේගේ පිළිතුර වනුයේ තමාට කැමති දෙයක් කරන්න යන්නය. පුද්ගල නිදහස හෙවත් ස්වඡන්දතාවය පිළිබඳ සාත්‍රේ රචනා කළ විවිධ ග්‍රන්ථයන්හි තොරතුරු දක්නට ලැබේ. එම ග්‍රන්ථ අතර පැවත්ම හා ශූන්‍යත්වය (Being and Nothingness) නමින් රචිත ග්‍රන්ථය සුවිශේෂී වේ. සාත්‍රේ බෙදීම්වලින් යුක්ත නියතිතාවයන්ට විරුද්ධ වනුයේ මෙම ග්‍රන්ථයේදීය.[17] නිදහස පුද්ගලයාට අවශ්‍ය සාධකයක් සේ පෙන්වා දුන් මොහු එමගින් මිනිස් ක්‍රියාකාරීත්වය හා සවිඥානිකත්වය ඇති වන බව පෙන්වා දුන්නේය. සාත්‍රේ පෙන්වා දෙන්නේ මිනිසාට සුවිශේෂී චින්තන හැකියාවක් පවතින බැවින් ස්වඡන්දතාවයෙන් යුතුව ක්‍රියා

කළ යුතු බවයි. පුද්ගලයා වෙනත් වස්තු වෙනුවෙන් පැවතීම හෙයින් මෙකී ස්වඡන්දතාවය යටපත් වී ඇත. කියකිගාඩ් සඳහන් කළ ඉච්ඡාභංගත්වය මෙන්ම සන්තාපය ඇති වනුයේ මේ හේතුවෙනි. මේ සඳහා විකල්පයක් ලෙස සාත්‍රේ යෝජනා කරනුයේ ස්වඡන්දතාවය පවත්වා ගත යුතු බවයි. එසේම සාත්‍රේ විසින් 1947 වර්ෂයේ දී රචනා කරණ ලද කෙටි ලිපියක් වන 'සාංදෘෂ්ටික වාදය යනු මානව වාදයකි'[18] යන ලිපියෙහි සාරධර්මවාදී දාරශනිකයන් විවේචනයට ලක් කොට තිබේ. එයට හේතුව වනුයේ සාරය පැවත්මට පූර්ව වේය යන මතයයි. එකී මතය ප්‍රතික්ෂේප කරමින් සාත්‍රේ පෙන්වා දෙන්නේ පැවැත්ම සාරයට පූර්ව වේය යන්නය. පැවැත්ම සාරයට පූර්ව වනුයේ විශ්වමාපක දේවවාදය ප්‍රතික්ෂේප කරන බැවිනි.

### ඇල්බෙයා කැමූ

කැමූ සාත්‍රේ සේ විවිධ සාහිත්‍යාංගයන් මගින් සිය දර්ශනය ව්‍යාප්ත කළ ද සාත්‍රේට තරම් අනුගාමික පිරිසක් සිටි බවක් සඳහන් නොවේ. 'සිසිපස්ගේ මිත්‍යා කථාව, පිටස්තරයා, කැලිගියුලා, මහාමාරිය' ආදී කෘති කැමූ පිළිබඳ සාකච්ඡා කරන කල්හි සුවිශේෂී වේ. මොහු සමස්ත ජීවිතය මායාකාරී බවකින් යුතු එකක් බව සඳහන් කළේය. 'සිසිපස්ගේ මිත්‍යා කතාව' නම් කෘතියෙන් මිනිසා කෙතරම් රැවටී ඇත්ද යන වග කැමූ විසින් පෙන්වා දී තිබේ. ග්‍රීක මිත්‍යා කතාවකට අනුව සිසිපස් දඬුවමක් බුක්ති විඳී. දෙවියන් විසින් නියම කරන එම දඬුවම වනුයේ කන්දක් මුදුනට විශාල ගලක් ගෙන ගොස් තැබීමය. ගල කොතරම් ප්‍රමාණයක් කඳු මුදුනට රැගෙන ගිය ද නැවත පහළට වැටේ. සිසිපස් මෙය දඬුවමක් බව දැන දැන සිදු කරනු ලැබේ. කැමූ සඳහන් කරනුයේ මෙලොව ජීවත් වන මිනිසා ද සිසිපස් හා සමාන බවයි. නමුත් සිසිපස් සාමාන්‍ය මිනිසාට වඩා ඉදිරියෙන් සිටී. එයට හේතුව වනුයේ සිසිපස් තමා දඬුවමක් විඳින බව දැන දැන එය සිදු කිරීමය. සාමාන්‍ය මිනිසා රැවටී ඇති බැවින් සිසිපස් හා සමාන නොවන බව කැමූ පවසයි. මිනිසා මායාවකට පැටලී ඇති බැවින් යථාර්ථවත් විය යුතු බව කැමූගේ අදහසයි. එහෙත් සිදු වනුයේ අපේක්ෂා භංගත්වය පමණි. මේ හේතුවෙන් කැමූ වරෙක සිය දිවිනසා ගැනීම සාධාරණ බව දක්වා ඇත. නමුත් එය මිනිස් පැවැත්ම යථාර්ථවත් කිරීමට හේතු නොවන බැවින් විසඳුම් කිහිපයක් කැමූ යෝජනා කරයි.

1. රසික නිර්මාණය තුළින් තමාගේ පුද්ගල අභ්‍යන්තර භාවය ප්‍රකට කිරීම.

2. අවට සමාජය කෙරෙහි මහත් මානව භක්තියකින් ජීවත්වීම.

3. ඉතා අසීරුවෙන් එනම් කෙසේ හෝ ජීවන ගැටලුවලට මුහුණ දීම.[19]

කැමූ රචනා කරන ලද 'මහාමරියා' නවකතාවෙන් පුද්ගලයාගේ සමාජ පැවත්ම සකස් විය යුතු ආකාරය මනාව පැහැදිලි කරයි. මහාමරියා නමැති රෝගයක් හට ගැනීමෙන් පසු නගර වැසියෝ බොහොමයක් මිය ගියහ. රෝගය නොවැළඳුන නගර වැසියෝ නගරය අත්හැර ගියහ. නමුත් 'රිය' නම් වෛද්‍යවරයෙක් තවත් කිහිප දෙනෙකුගේ මැදිහත්කම සමඟ රෝගීන් සුවපත් කිරීමට යොමු විය. අනතුරුව එම රෝගයෙන් නගර වැසියන් සුවපත් කිරීමට 'රිය' නම් වෛද්‍යවරයා ඇතුළු පිරිසට හැකි විය. මෙයින් කැමූ දක්වනුයේ මානව දයාවෙන් යුක්ත වීම අවශ්‍ය සාධකයක් විය යුතු බවයි. මානව දයාවෙන් යුක්ත විය හැකි නම් ජීවිත අර්ථවත් කළ හැකි බව කැමූ සඳහන් කරනු ලැබේ.

**සමාලෝචනය**

බටහිර මෙන්ම පෙරදිග දර්ශනයේ ද සාංදෘෂ්ටික වාදී අදහස් යම් යම් අවස්ථාවන්හි පැවති බව හඳුනාගත හැකිය. එහෙත් නිශ්චිත වශයෙන් නව දාර්ශනික සම්ප්‍රදායක් ලෙස වර්ධනය වනුයේ සමකාලීන දාර්ශනික අවධියෙහිය. මිනිසා සම්බන්ධයෙන් හා මිනිසාගේ පැවැත්ම සම්බන්ධයෙන් අවධානය යොමු කොට තිබෙන සාංදෘෂ්ටික වාදයෙහි ප්‍රභේද ද්වයක් පවතින බව දාර්ශනික අධ්‍යයන තුළින් තහවුරු කළ වේ. දේව වාදී හා අදේව වාදී යනුවෙන් හැඳින්වෙනුයේ එයයි. මිනිසාගේ පැවැත්ම සම්බන්ධයෙන් ධනාත්මක මෙන්ම ඍණාත්මක අදහස් සාංදෘෂ්ටික වාදීන් විසින් දක්වා තිබුණ ද ඒ සියල්ලක් තුළින් අපේක්ෂා කොට ඇත්තේ මිනිසාගේ සතුට තහවුරු කිරීම බව හැඟේ. සාහිත්‍යකරණය මඟින් අදහස් මතු කිරීමට උත්සාහ කිරීම විශේෂ කරුණකි. විදග්ධ මෙන්ම කයෝර අදහස්කරණයෙන් ඈත්ව සරළ හා සාහිත්‍යට අනූනව කරුණු දක්වා ලීම මඟින් විශද වනුයේ

සාමාන්‍ය ජනයා සිය විෂය පථයට එකතු කර ගැනීමේ ස්වභාවයක් පවතින බවය. මිනිසා මිනිසාගෙන් ඈත් වූ විට නිර්මාණ වන තත්වය ප්‍රශංසනීය නොවේ. එබැවින් දේව නියමයන්ට යටත්ව හෝ විතැන්ව මිනිසාගේ පැවැත්ම තහවුරු කරනු වස් බිහි වූ දාර්ශනික සම්ප්‍රදායක් ලෙස සාංදෘෂ්ටික වාදය ඇගයුමට ලක් කළ හැකි වේ.

## ආන්තික සටහන්

1 ගුණවර්ධන, පී. ඩයස් (1994). සාංදෘෂ්ටික වාදය මිනිසා පිළිබඳ දර්ශනය, හොරගොල්ලː නිශාන්ත ප්‍රකාශකයෝ, 29.

2 අබේපාල, රෝලන්ඩ් හා අබේපාල, අරුන්දතී (2010) සාංදෘෂ්ටික හා මානුෂික මනෝවිද්‍යා ප්‍රවේශ, කොට්ටාවː සාර ප්‍රකාශන, 11.

3 රාජපක්ෂ, ධර්මා (2002) සාංදෘෂ්ටික වාදය සහ ආධ්‍යාත්මික පෙරළිය පසුබිම් වූ සිංහල නවකථා, ස්ථානය සඳහන් නොවේː කතෘ ප්‍රකාශන, 1.

4 එම. 2-3.

5 ගුණවර්ධන, පී. ඩයස් (1994) සාංදෘෂ්ටික වාදය මිනිසා පිළිබඳ දර්ශනය, හොරගොල්ලː නිශාන්ත ප්‍රකාශකයෝ, 67.

6 Sarthe, Jean poul (Trans.) by Bernard frechtman 'Existentialism' Personal Philosophy.

7 එදිරිසිංහ, දයා සහ පෙරේරා, ඥානදාස (2001) දාර්ශනික විමර්ශන, දෙහිවලː වත්මා ප්‍රකාශකයෝ, 218.

8 කලන්සූරිය, ඒ.ඩී.පී. (2007) නූතන බටහිර දර්ශනය, බත්තරමුල්ලː අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, 31.

9 ධර්මසිරි, ගුණපාල (2007) දාර්ශනික ප්‍රශ්න, බත්තරමුල්ලː අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, 187.

10 එම. 187.

11 වීරසේකර, යාපාරත්න 'සොරේන් කියකිගාඩ් හා සාංදෘෂ්ටිකවාදය' (සංස්.) මැදගම්පිටියේ විජිතධම්ම හිමි සහ මිරිස්වත්තේ විමලඤාණ හිමි, දර්ශන අධ්‍යයන, (2011) වාද්දුවː ප්‍රවචනෝදය පිරිවන, 366.

12 එදිරිසිංහ, දයා සහ පෙරේරා, ඥානදාස (2001) දාර්ශනික විමර්ශන, දෙහිවලː වත්මා ප්‍රකාශකයෝ, 218.

13 අබේපාල, රෝලන්ඩ් හා අබේපාල, අරුන්දතී (2010) සාංදෘෂ්ටික හා මානුෂික මනෝවිද්‍යා ප්‍රවේශ, කොට්ටාවː සාර ප්‍රකාශන, 11.

14 එම. 16.

15 ධර්මසිරි, ගුණපාල (2007) දාර්ශනික ප්‍රශ්න, බත්තරමුල්ල: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, 190.

16 අබේපාල, රෝලන්ඩ් හා අබේපාල, අරුන්දතී (2010) සාංදෘෂ්ටික හා මානුෂික මනෝවිද්‍යා ප්‍රවේශ, කොට්ටාවා: සාර ප්‍රකාශන, 18.

17 බණ්ඩාර, වත්සුල (2017) මහද්වීපික දාර්ශනික ප්‍රවේශය, ස්ථානය සඳහන් නොවේ: කතෘ ප්‍රකාශන, 103.

18 රාජපක්ෂ, ධර්මා (2002) සාංදෘෂ්ටික වාදය සහ ආධ්‍යාත්මික පෙරළිය පසුබිම් වූ සංහල නවකථා, ස්ථානය සඳහන් නොවේ, කතෘ ප්‍රකාශන, 94.

19 එදිරිසිංහ, දයා සහ පෙරේරා, ඥානදාස (2001) දාර්ශනික විමර්ශන, දෙහිවල: වත්මා ප්‍රකාශකයෝ, 220.